**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - 2022**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ (''මණ්ඩලය'') 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 69 වගන්තිය ප්‍රකාරව ජංගම වගකීම් ලෙස හඳුනා ගත යුත්තේ වගකීම් වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසු මාස 12 ක් ඇතුලත නිරවුල් කිරීමට නියමිත සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී නිරවුල් කිරීමට අපේක්ෂා කරන වගකීම් සඳහා පමණි. එසේ වුවද, රු.255,675,927 ක මුළු වෙළඳ ණයහිමි ශේෂයෙන් රු.150,440,727 ක් ක්‍රියාකාරී නොවන වර්ෂ 5 ට වැඩි නිරවුල් නොකළ ණයහිමි ශේෂ වේ. එමෙන්ම ණයහිමි ශේෂය තුළ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය නමින් රු.3,821,690 ක හර ශේෂයක් ඇතුළත් කර තිබූ බැවින් එම වටිනාකමින් ණයහිමි ශේෂය අඩුවෙන් පෙන්නුම් කෙරුණි. | මෙම ශේෂයන් බොහෝමයක් මැණික් හා ස්වර්ණාභරණ ලබා දුන් සැපයුම්කරුවන් වේ. එම සැපයුම්කරුවන් භාණ්ඩ ලබා දී ඇත්තේ විකුණූ පසු මුදල් දීමේ පදනමින්ය. (Consignment Model) ඒ අනුව එම භාණ්ඩ අවුරුදු 5ක් වැනි කාලයක් තුල විකිණී නැති බව තහවුරු වේ. එබැවින් මෙම ශේෂයන් නිරවුල් කිරීමට ඇති ශේෂ නොවන අතර කපා හැරීමටද නොහැකි බව දන්වා ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 28 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ තොග ශේෂය තුල පවතින දෙවන ගුණත්වයේ රු.154,646,764 ක තොගයෙහි ඇතුළත් තොග ඌනතා, අළුත්වැඩියා කලයුතු තොග සහ ක්‍රියාකාරී නොවන තොගයන්හි සත්‍ය වටිනාකම නිරූපණය නොවන බැවින් ඒවා ශුද්ධ උපලබ්ධි අගයට පෙන්නුම් කර ගිණුම්ගත කර නොතිබුණි. | තොගවල ශුද්ධ උපලබ්ධි අගය ඉදිරි ගිණුම් වර්ෂවලදී ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 34 වගන්තිය ප්‍රකාරව තොග සම්බන්ධ සියළු අලාභයන්, අලාභය සිදුවූ කාලපරිච්ඡේදයේ වියදම් සේ හදුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත්, 2022 දෙසැම්බර් 31 දිනට පළමු ගුණත්වයේ තොගය තුල ඇතුළත් එකතු වටිනාකම රු.3,425,875 ක් වූ ඌණ තොග සම්බන්ධයෙන් එලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වසර ගණනාවක සිට එක් එක් වසර වලට අදාලව හඳුනාගත් තොග ඌණතාවල එකතුවක් වන අතර වියදමක් ලෙස කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් අවශ්‍ය වන බැවින් එම අනුමැතිය ලැබෙන තුරු මෙලෙස දක්වා ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව එකතු වටිනාකම රු.380,788,639 ක් වූ මණ්ඩලය සතු ඉඩම්, රු.19,279,453 ක් වටිනා පරිගණක උපාංග සහ රු.10,193,250 ක් වටිනා මෘදුකාංග ප්‍රත්‍යාගණනය කර වර්තමාන වෙළඳපොල වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වර්තමානයේ පවතින මූල්‍ය අපහසුතා හේතුකොටගෙන මෙවැනි කාර්යයක් සිදු කිරීමට ආයතනයට හැකියාවක් නොපවතින බැවින් මූල්‍ය තත්ත්වය යහපත් වූ පසු මෙම කටයුත්ත සිදු කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොටුව ලක්සල ගොඩනැගිල්ලෙහි නවීකරණ කටයුතු අත්හිටුවා ඇති බැවින් ඒ වෙනුවෙන් දරන ලද රු.45,451,390 ක් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කෙරී ගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම වියදම දරා ඇත්තේ ගොඩනැගිල්ලේ යම් යම් කොටස් කඩා ඉවත් කිරීමට වේ. මේ වන විට ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අතර මග නවතා ඇති බැවින් එය කෙරීගෙන යන වැඩ යටතට දමා ඇත. | නවීකරණ කටයුතු අවසන් කර නිවරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1993 වර්ෂයේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් පවරා දෙන ලද මණ්ඩලය විසින් ව්‍යාපාර කටයුතු සිදු කරන නුවරඑළිය සහ තුම්මුල්ල පිහිටි දේපළ වල නීත්‍යානුකූල හිමිකාරිත්වය ලබා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතියක් අනුව 1993 වර්ෂයේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීමේදී එම දෙපාර්තමේන්තුවේ සිටි සේවකයින් හා ගොඩනැගිලි ඇතුලු වත්කම් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට පැවරීමේදී නුවරඑළිය, කටුබැද්ද සහ තුම්මුල්ල යන දේපළද පවරා දී ඇත. | නීත්‍යානුකූල හිමිකාරිත්වය ලබා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේ සිට පැවත එන සත්‍ය වශයෙන් නොපවතින රු.986,112 ක බැංකු අයිරාවක් මූල්‍ය ප්‍රකාශන වල ජංගම වගකීම් යටතේ ඇතුළත් කර තිබුණ ද සමාලෝචිත | බැංකු ශේෂ සනාථන ලිපිය අනුව බැංකු ශේෂය රු.99,973 ක් වන අතර ඉහත ජංගම ගිණුමට අදාළ මුදල් | නාමික වටිනාකමක් පවතීනම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පොත අනුව ශේෂය රු.(986,112) ක අයිරාවක් විය. ඒ අනුව ඒම වටිනාකම බැංකු අයිරා යටතේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.986,112 ක් ලෙස පෙන්නුම් කර ඇත. තවද එම අයිරා වටිනාකම 2015 වසරේ වැරදි ලෙස ගිණුම් ගතවූ සටහනක් හේතුවෙන් ඇති වී ඇති බැවින් එයද නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | |
| (ඇ) | 2022 වර්ෂයේදී විදේශීය විකුණුම් සඳහා ගිවිසුම්ගත වීමේදී එකඟ වූ පුරස්කාර ගාස්තු රු.9,090,000 ක් වෙනත් ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී කිසිදු විදේශීය විකුණුම් සිදුවී නොතිබුණි. | 2022 වර්ෂයේදී ගිවිසුම්ගත කරන ලද ෆ්‍රැන්චයිස් (Franchise) අලෙවි නියෝජිතයින් ව්‍යාපාර ආරම්භ කර නොතිබූ බැවින් මෙම පුරස්කාර ගාස්තු ගෙවීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබෙන අතර මෙම අගයන් ගිණුම් තුලින් ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත. | සත්‍ය වශයෙන්ම ලැබෙන ආදායම් පමණක් ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ) | භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව අනාවරණය වූ තුම්මුල්ල ප්‍රදර්ශනාගාරයට අයත් විකුණුම් වටිනාකම රු.2,915,960 ක් වූ තොග ඌනතාවයක් හා බත්තරමුල්ල ප්‍රදර්ශනාගාරයට අයත් බර තැබූ සාමාන්‍ය පිරිවැයට රු.876,452 ක් වටිනා තොග ඌනතාවයක් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර හෝ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | තොග සමීක්ෂණ අංශය මගින් තොග සමීක්ෂණයක් කිරීමෙන් සහ 2023 වර්ෂයේදී තොග සමීක්ෂණ මණ්ඩලයක් මගින් මෙම ඌණතාවයන් නිසි ලෙස තක්සේරු කොට 2023 ගිණුම් තුල අදාල වෙනස්කම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | තොග ඌනතා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර හෝ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | තුම්මුල්ල ප්‍රදර්ශනාගාරයේ භෞතික තොග සත්‍යාපන වාර්තා අනුව සමාලෝචිත වර්ෂයට අදාලව කිසිදු හානියක් වාර්තා නොවුණ ද, මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට රු.1,712,412 ක තොග හානියක් ගිණුම්ගත කර තිබුණි. | අදාල වර්ෂයේ තොග හානි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන අතර තොග හානි අදාල ප්‍රදර්ශනාගාරයේ තොග හානි ගිණුමට බැර කිරීමට තොග සමීක්ෂණ අංශයට බලය ලබා දී ඇත. තවද එම තොග ප්‍රදර්ශනාගාරයේ අලෙවිය සඳහා ඇති තොග තුලින් | තොග සත්‍යාපනයේ නිරවද්‍යතාවය තහවුරු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ඉවත් කළ යුතු වේ. එසේ වුවද තොග ගිණුම් තුල මුළු තොගයට හානි වූ තොගද ඇතුලත්ව ගිණුම්ගත කිරීම කරනු ලැබේ. | |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| දේපල පිරියත හා උපකරණ | 228,677,799 | 80,955,189 | 147,722,610 | වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු නිවැරදි ශේෂයන් ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ණයහිමි ශේෂය | 37,952,164 | උපලේඛණ හෝ ශේෂ සනාථ කිරීම් | පැරණි ශේෂ බැවින් මෙයට අදාල ලේඛණ ආයතනය සතුව නොමැති බැවින් ගිණුම් තුලින් ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මගින් කටයුතු කරන බව දන්වා ඇත. | උපලේඛණ හෝ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | වෙළඳ ණයගැති ශේෂය | 23,562,897 | ශේෂ සනාථ ලිපි | ශේෂ සනාථ ලිපි ලබා ගැනීම ඉතා දුෂ්කර කාර්යයක් වේ. මන්ද වෙළඳ ණය ගැතියන් ඔවුන්ගේ ලැබිය යුතු මුදල් පිළිබඳ දැනුමක් නොමැති බැවිනි. ශේෂ සනාථ ලිපි ලබා ගැනීමට කටයුතු සලසනු ඇත. | ශේෂ සනාථ ලිපි ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | උපචිත වියදම් | 6,546,541 | ගෙවිය යුතු පාර්ශවය | සනාථන ලේඛණ නොමැති බැවින් 2023 වර්ෂයේදී අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියට | ගෙවිය යුතු පාර්ශවය නිශ්චිතව හඳුනා ගැනීමට |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | යොමු කර ඉවත් කිරීමට කටයුතු සලසනු ඇත. | කටයුතු කළ යුතුය. |
| (ඇ) | මාර්ගස්ථ තොග | රු.11,014,318 | මාර්ගස්ථ තොග තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | මෙම ගිණුමේ ශේෂය නිවැරදි කිරීම ඉතා අපහසු කාර්යයක් වන අතර ඉදිරි වසරවලදී එය නිවැරදි කිරීමට හැකිතාක් දුරට කටයුතු කරනු ඇත. | මාර්ගස්ථ තොග ගිණුමේ ශේෂය වාර්ෂිකව පරීක්ෂාකර නිරවුල් කළ යුතුය. |

## 1.5 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීතිරීති /රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(5) | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අග්‍රිමය නැවත පියවිය යුතු වුවද ආයතනය විසින් 2022 වර්ෂය තුළ අවස්ථා 58 ක දී ලබාදුන් රු.2,274,351 ක අත්තිකාරම් මුදල් දින 20 ක සිට දින 285 ක් අතර කාල පරාසයක ප්‍රමාදයක් සහිතව පියවා තිබුණි. | ආයතනයේ එදිනෙදා මෙහෙයුම් ගැටළු හේතුවෙන් ප්‍රමාදය සිදුවන නිසා, මේ පිළිබඳව විශේෂ සැලකිල්ලක් ගෙන අතුරු අග්‍රිම ලබා දුන් නිලධාරීන්ට මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට දැනුම් දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 371 (2) (ආ) | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා දීමට හැකි වුවත් ඊට පටහැනිව රු.100,000 ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම රු.2,360,379 ක් අවස්ථා 10 කදී නිකුත් කර තිබුණි. | විශේෂ වෙළඳ භාණ්ඩ මිලදී ගැනීමක් උදෙසා සභාපති අත්සනින් ලබාගත් රු.500,000/-ක මුදලක් වේ. තවද මෙම විශේෂ මිලදී ගැනීම සිදුකරන ලද්දේ ලාක්ෂා භාණ්ඩ ණයට සැපයුම්කරුවන් ලබා නොදීම හේතුවෙන් මුදල් ලබා දී අවශ්‍ය භාණ්ඩ ප්‍රදර්ශනාගාර වෙත මිලදී ගැනීමට සිදුවූ බැවිනි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 21 හා 23 වගන්ති | 2015 නොවැම්බර් 19 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණය පරිදි නිලධාරිනියන් දෙදෙනෙකු වැඩ තහනමකට ලක් කර තිබුණද 2023 මැයි 20 විගණන දින වන විටත් මණ්ඩලයේ විනය බලධරයා විසින් විනය නියෝග ලබා දී නොතිබුණි. | වැඩ තහනමකට ලක් කර ඇති නිලධාරීන් වෙත මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබූ චෝදනා පත්‍ර සඳහා නියමිත කාල වකවානුවකට පෙර චූදිත නිලධාරීන් විසින් පිළිතුරු ඉදිරිපත් කර නොමැති අතර ඒ අනුව විනය පරීක්ෂණ ආරම්භකොට පවත්වා ගෙන ගොස් ඇත. | ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **2021.11.16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති රාජ්‍ය ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතෙහි** 6.6 ඡේදය | (i)කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 05 ක් ප්‍රමාද වී 2023 ජුලි 18 දින ඉදිරිපත් කර තිබුණි. | 2022 වර්ෂයේදී අනපේක්ෂිත ලෙස ආයතනයේ ගිණුම්කරණය සහ අලෙවිය කරන්නාවූ SAP ERP පද්ධතිය 2022 දෙසැම්බර් මාසයේදී බිඳ වැටීම නිසා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| | | (ii)විගණන වාර්තාව සමඟ වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2020 හා 2021 වර්ෂවල වාර්ෂික වාර්තා 2023 අගෝස්තු 20 වන විටත් සභාගත කර නොතිබුණි. | 2020 සහ 2021 වර්ෂයන්හි කෙටුම්පත් වාර්ෂික වාර්තා සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. | නියමිත දිනට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය
### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 99,040,670 ක අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු.58,546,847 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.40,493,823 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ ආදායමෙහි රු.146,127,213 ක වර්ධනයක් පෙන්නුම් කළද, ඊට සාපේක්ෂව පරිපාලන වියදම්, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් සහ මූල්‍ය පිරිවැය රු.68,268,047 කින් ඉහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

පසුගිය වර්ෂයේ දී 1.14 ක් ව පැවති ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ දී 1.02 ක් දක්වා පහත බැස තිබුණි. ඒ අනුව මණ්ඩලය සතු ජංගම වත්කම් ප්‍රමාණය ජංගම වගකීම් පියවීමට පමණක් සෑහෙන බැවින් මණ්ඩලයේ ද්‍රවශීලතාවය ඉතාමත් පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. එමෙන්ම ක්ෂණික අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව තවත් අඩු වී ඇති බවත් ජංගම වත්කම් වලින් සියයට 87 ක් ම තොගය සහ ඉදිරියට කළ ගෙවීම් නිරූපණය කිරීමත් මෙම තත්වයට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය
### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2012 නොවැම්බර් 30 දින තුරඟ තරඟ පිටියේ ප්‍රදර්ශනාගාරය වෙනුවෙන් වසර 10 ක කාලයකට ගිවිසුම්ගත වීමේදී රු.5,888,000 ක ආපසු අයකර ගත නොහැකි තැන්පත් මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද, 2018 දෙසැම්බර් 26 දින මෙම අලෙවි ප්‍රදර්ශනාගාරය වසා දමා තිබුණි. එබැවින් මෙය අනාර්ථික ගනුදෙනුවක් බව විගණනයේදී නිරීක්ෂණය විය. | ඉදිරියේදී මණ්ඩලය විසින් මාසික බදු කුලී ගෙවීමේ පදනම මත ගොඩනැගිලි ඉඩකඩ ලබා ගැනීමේදී නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ගිවිසුම්හි කොන්දේසි හා නියමයන් පිළිබඳ වැඩිදුර අධ්‍යනයක් සිදුකර තීරණ ගනු ඇත. | ගිවිසුම් කොන්දේසි පිළිබඳ නිසි අවධානය යොමු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2018 වර්ෂයේ මණ්ඩලය විසින් වසා දමා ඇති කටුබැද්ද ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද ණයට විකුණුම් සඳහා ගැණුම්කරුවන් 8 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.1,182,386 ක මුදල අයකර ගැනීමට කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2023 වර්ෂය තුළදී කටුබැද්ද ව්‍යාපෘතිය තුලින් අයවිය යුතු ගැණුම්කරුවන් පිළිබඳ සලකා බලා එම අයකිරීම් මණ්ඩලය වෙත ලබා ගැනීමට කටයුතු සලසනු ඇත. | ලැබිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1991 ජුලි 05 දිනැති හා අංක 670 දරණ ගැසට් පත්‍රය මඟින් ගාල්ල අලෙවි ප්‍රදර්ශනාගාරය ඇති ඉඩම සහ දෙමහල් ගොඩනැගිල්ල මණ්ඩලය වෙත පවරා දී තිබුණද නීත්‍යානුකූලව හිමිකම ලබා ගැනීමට විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි. | නීත්‍යානුකූල හිමිකම ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | නීත්‍යානුකූලව හිමිකම ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාල පරාසය තුල අයවිය යුතු තුම්මුල්ලේ බැරිස්ටා ආපනශාලාවෙන් රු.456,770 ක්, බැරිස්ටා කෝෆි ලංකා ආයතනයෙන් රු.4,243,949 ක්, තරුමිලා මල් සමාජයෙන් රු.20,000 ක් හා සුපර් බෑන්ඩ් ව්‍යාපාරික ස්ථාන 8 කින් රු.4,869,200 ක් වශයෙන් රු. 9,589,919 ක් 2022 දෙසැම්බර් 31 වන විටත් හිඟව පැවති අතර එම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බැරිස්ටා ආපන ශාලාවෙන් ලැබිය යුතු මුදල් ලබා ගැනීමට මේ වන විට කටයුතු සලසා ඇති අතර තරුමිලා මල් සමාජයෙන් අයවිය යුතු මුදල අය නොකර ගැනීමට කළමණාකරන රැස්වීමේදී එකඟතාවයට එන ලදි. ඒ අනුව ගිණුම් තුලින් මෙම අගය ඉවත් කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. තවද සුපර් බ්‍රෑන්ඩ් වලින් ලැබිය යුතු මුදල් කොරෝනා වසංගත කාලය සැලකිල්ලට ගෙන ගිණුම් තුලින් ඉවත් කිරීමටද කටයුතු සලසනු ඇත. | ලැබිය යුතු මුදල් නොපමාව අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලය විසින් 2011 – 2017 දක්වා කාලපරිච්ඡේදය තුළදී කොටුව ලක්සල ගොඩනැගිල්ල උකසට තබා ලංකා බැංකුවෙන් අවස්ථා 12 ක දී රු.849,481,500 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. ණය වාරික හා පොළී මුදල් නිසි පරිදි නොගෙවීම හේතුවෙන් වරින් වර උපචිත පොළී මුදල් ද ප්‍රාග්ධනිත කර බැංකුව විසින් නව ණය මුදල් 14 ක් ලෙස ප්‍රතිලේඛණගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එවැනි ණය මුදල් 8 ක එකතු වටිනාකම රු.332,607,065 ක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි. | 2019 වර්ෂයේදී සිදුවූ පාස්කු ප්‍රහාරය හමුවේ සංචාරක ව්‍යාපාරය කඩා වැටීමත් 2020/2021 වර්ෂ වලදී පැවති කොවිඩ් වසංගතය හේතු කොටගෙන සංචාරකයින් පැමිණීම සම්පූර්ණයෙන්ම අත්හිටුවීමත් නිසා බැංකු ණය පියවීමටද අසීරු විය. එම නිසා ණය ප්‍රතිලේඛණගත කරන ලදි. | බැංකු ණය කළමණාකරණය කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත සපයන ලද ප්‍රතිමූල්‍ය ණය පහසුකම හරහා 2013 වර්ෂයේ දී මණ්ඩලය වෙත රු.මිලියන 200 ක ණය | 2019 පාස්කු ප්‍රහාරය සහ 2020/2021 වර්ෂවලදී ඇතිවූ කොවිඩ් වංසගතය හේතු කොටගෙන අලෙවි ආදායම කඩා වැටීමකට ලක්වූ හෙයින් ණය වාරික ගෙවීමට මණ්ඩලයට නොහැකි විය. ඒ අනුව 2020/2021 වර්ෂ වලදී උපචිත වූ පොළිය සමඟ වසර 10 ක් තුල ගෙවීමට | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුදලක් ලබාදී තිබුණි. නියමිත පරිදි ණය පොළී නිරවුල් නොකිරීම හේතුවෙන් සමුච්චිත වූ රු.12,909,761 ක ශේෂය ද නව ණය මුදලක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවති ණය ශේෂය රු.171,009,585 ක් ද 2021 හා 2022 වර්ෂ සඳහා උපචිත වූ පොළීය රු.33,721,736 ක් ද විය. දිගින් දිගටම ණය සහ පොළී මුදල් නොගෙවීම මත 2022 ඔක්තෝබර් 14 දිනැති හා අංක RDB/HO/RE/122/4 දරන ලිපිය මඟින් නව ණය ගෙවීමේ සැලැස්මක් බැංකුව විසින් යෝජනා කර තිබුණ ද මණ්ඩලය ඊට එකඟතාවය පළකර නොතිබුණි. | සැලැස්මක් ලබා දී තිබුණ ද එම පොලිය වන රු.මි.33 පිළිබඳව මණ්ඩලය සෑහීමකට පත් නොවූ හෙයින් මෙම මුදල මුළු රටෙහි ඇති වූ ආර්ථික කඩා වැටීම හේතු කොටගෙන බැවින් මෙම මුදල සාධාරණ ලෙස පොළිය අඩුකර ගැනීමට ඉදිරියේදී බැංකුව සමඟ සාකච්ඡා කිරීමට කටයුතු සලසනු ඇත | |
| (ඊ) | තොග සත්‍යාපන වාර්තා අනුව තොගයෙහි ඇතුලත් විකුණුම් වටිනාකම රු.340,069,730 ක මැණික් හා ස්වර්ණාභරණ දීර්ඝ කාලයක් තිස්සේ දුර්වර්ණ වෙමින් පවතින බැවින් ඒවා විශේෂ වට්ටම් ලබාදෙමින් හෝ යෝග්‍ය අලෙවි උපායමාර්ග මඟින් විකිණීමට කටයුතු කර නොතිබුණි. | දුර්වරණ වූ ස්වර්ණාභරණ සැපයුම්කරුවන් වෙත නැවත ලබාදීමට (Return) කටයුතු සලසා ඇත. | තොගය වඩා ඵලදායි ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.23,562,897 ක් වුවද මෙම ශේෂය තුළ විවිධ රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු රු.50,000 ට වැඩි ණයගැති ශේෂයන්ගේ එකතුව රු.10,560,711 ක් වුයෙන් එම ශේෂ අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර එම ණයගැතියන් සඳහාම නැවත භාණ්ඩ අලෙවි කර තිබුණි. | මෙම ශේෂ ඉතා පැරණි ණයගැති ශේෂ වන අතර මෙයට අදාල ලිපිගොණු නිරීක්ෂණය කර අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නිලධාරීන්ගෙන් අයකරගෙන තිබූ ඇප මුදල් අදාළ නිලධාරීන් නමින් ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් | 2023 වර්ෂයේදී ඇප මුදල් සඳහා ලබාගෙන ඇති තැන්පතු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අනුව ස්ථාවර | ඉතිරි කිරීමේ ගිණුම් නොපමාව ආරම්භ කිරීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| නොකොට එකතුව රු.2,010,000 ක මුදලක් ජංගම ගිණුමේ තැන්පත් කර තිබූ අතර එම මුදලට වාර්ෂිකව සියයට 6 බැගින් රු.1,261,533 ක පොළියක් එකී නිලධාරීන් වෙත ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි. | තැන්පතුවක් බවට මාරු කිරීමට හෝ අදාල සේවකයින් සඳහා තනි තනි වශයෙන් ඉතිරි කිරීමේ ගිණුම් විවෘත කිරීමට කටයුතු සලසනු ලැබේ. | යුතුය. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර ගණනාවක සිට පැවත එන රු.12,502,564 ක ව්‍යාපෘති රැඳවුම් මුදල් හා ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂයේ ඇතුළත් රු.3,838,357 ක ශේෂ හා වෙළඳ භාණ්ඩ හා වෙළඳ නොවන භාණ්ඩ මිලදී ගැනීමට හා පරිපාලන කටයුතු වලට ලබා දී ඇති රු.16,026,936 ක අත්තිකාරම් ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේදී විශේෂ අවධාරණයට යොමු කර නිරවුල් කිරීමට උපදෙස් දී ඇත. | පැරණි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගාල්ල උණවටුන සළුසල ආයතනයට අයත්ව තිබූ අක්කර 01 පර්චස් 30.6 ක භූමිය හා ගොඩනැගිලි 2012 ඔක්තෝබර් 11 දිනැති හා අංක 12/1523/553/020 දරන කැබිනට් තීරණය මගින් මණ්ඩලය වෙත පවරා දී ඇත. ඒ අනුව ගැනුම් ප්‍රතිෂ්ඨාව ලෙස සලකා මණ්ඩලය විසින් 2012 දෙසැම්බර් 12 දිනැතිව රු15,248,575 ක් ගෙවා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ ද දේපලෙහි නීත්‍යානුකූල හිමිකාරත්වය හා පරිහරණයකිරීමේ අයිතිය ලබාගැනීමට අපොහොසත් වී තිබුණි. තවද කටුබැද්ද පිහිටි දේපලවලද නීත්‍යානුකූල හිමිකාරත්වය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම දේපළෙහි අයිතිය ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත නිත්‍යානුකූල ඔප්පුවක් මගින් පවරා දීමට අවශ්‍ය කටයුතු කරන මෙන් සී/ස ලංකා සළුසල ආයතනයෙන් කිහිප වතාවක්ම ලිඛිත ඉල්ලීම් කර ඇතත් එම පවරා දීමේ කටයුතු සී/ස ලංකා සළුසල විසින් සිදුකර නොමැත.<br><br>ඊට හේතු වශයෙන් අදාල දේපල සම්බන්ධව මේ වනවිට උසාවියේ නඩුවක් පවතින බවය.<br>කෙසේ නමුත් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත දකුණු පළාත් සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතියක් සඳහා එම අමාත්‍යාංශයේ නිර්දේශ මත ඉහත දේපළ කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට මුදල් ගෙවා ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | දේපලෙහි නීත්‍යානුකූල හිමිකාරත්වය හා පරිහරණය කිරීමේ අයිතිය හෝ ගෙවූ මුදල් නැවැත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කැබිනට් අනුමැතිය මත 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.175,118,237 ක් වැයකර නවීකරණය කරන ලද කෞතුකාගාර ගොඩනැගිල්ලට අදාළ ගිවිසුම් කොන්දේසි වලට දෙපාර්ශවය එකඟතාවය පල නොකිරීම නිසා 2023 ජනවාරි 01 වන දින අලෙවි ප්‍රදර්ශනාගාරය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මුද්‍රා තබා තිබුණි. එහෙත් 2023 ජුනි 10 විගණිත දින වන විට මුද්‍රා තබා මාස 06 ක් ගත වී තිබුණද ප්‍රදර්ශනාගාරය නැවත ලබා ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබූ අතර, එකතුව රු.99,777,436 ක් වටිනා තොග ප්‍රදර්ශනාගාරය තුළ නිෂ්ක්‍රියව තිබුණි. | කෞතුකාගාර ලක්සල ප්‍රදර්ශනාගාරය හැකි ඉක්මනින් නැවත විවෘත කර ගැනීමට හෝ එහි නවීකරණ හා සංවර්ධන කටයුතු සඳහා මණ්ඩලය වැය කර ඇති මුදල් ආපසු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයන්හි ගරු අමාත්‍යවරුන් හා ලේකම්වරුන් සමඟ මේ වන විට සාකච්ඡා කරමින් පවතී. | ප්‍රදර්ශනාගාරය නැවත ලබා ගැනීමට හෝ තොග ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොටුව අලෙවි ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ලෙහි වර්ග අඩි 1200 ක් වැනි ඉතා කුඩා ඉඩ ප්‍රමාණයක් පමණක් භාවිතා කරන බැවින් වර්ග අඩි 40830 ක් පමණ වූ ගොඩනැගිලි පරිශ්‍රය දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රියව පවතින බවත් නිරීක්ෂණය විය. | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය ඇතිව මෙම ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම, සංරක්ෂණය කිරීම හා අතිරේක ආදායමක් උපයාගත හැකි පරිදි අළුත්වැඩියා හා නවීකරණ කටයුතු ආයෝජකයාගේ වියදමින් සිදුකොට ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට හා එහි වර්ග අඩි 2,000 ක ඉඩකඩක් ලක්සල ප්‍රදර්ශනාගාරයක් සඳහා වෙන්කිරීම, ගොඩනැගිල්ල උකස්කර ලක්සල ආයතනය ලබාගෙන ඇති බැංකු ණය පියවීම හා මෙම ගොඩනැගිල්ලට අදාළ අනෙකුත් වගකීම් බේරුම්කිරීමට ප්‍රමාණවත් ආයෝජනයක් කිරීමේ කැමැත්තක් දක්වන හා ඊට ශක්තියක් ඇති "ශ්‍රී ලාංකීය ආයෝජකයින් සහ ආයතන" වෙතින් "ව්‍යාපාරික අභිලාෂයන් සහිත යෝජනා" කැඳවා සුදුසු පාර්ශවයක් තෝරා ගැනීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී. | නිෂ්ක්‍රියව පවතින ගොඩනැගිල්ලෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |